ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

**<u>ඉන්දිය මහ කොමසාරිස්තුමා ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ දෙමුහුන් විදුලි බලාගාර නිරීක්ෂණය කරයි</u>**

ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා 2026 ජූනි 03 වන දින ඩෙල්ෆ්ට් දූපතේ දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිය නිරීක්ෂණය කළේය. මෙම ව්‍යාපෘතිය දැනට ශ්‍රී ලංකාවේ යාපනයට ඔබ්බෙහි පිහිටි ඩෙල්ෆ්ට්, අනලතිව් සහ නයිනතිව් යන දූපත් තුනෙහි ක්‍රියාත්මක වමේන් පවතී.

2. මෙම ව්‍යාපෘතිය ඉන්දියානු රජයේ ඇමරිකානු ඩොලර් මිලියන 11ක ප්‍රදානයක් යටතේ ක්‍රියාත්මක කෙරේ. මෙතුළින් බලශක්ති ක්ෂේත්‍රය තුළ ද්විපාර්ශ්වික සහයෝගීතාවය උදෙසා ඉන්දියාවේ කැපවීම මෙන්ම ශ්‍රී ලංකාව තුළ ඉන්දිය සංවර්ධන සහයෝගීතාවයේ ජනතා කේන්ද්‍රීය ස්වභාවය අවධාරණය කෙරේ.

3. මෙම ව්‍යාපෘතිය අවශ්‍ය විටක ඩීසල් භාවිතය ද සහිතව සූර්ය බලය, සුළං බලය සහ බැටරි ප්‍රභවයන්ගෙන් විදුලිය ජනනය කරන අතර ආසන්න වශයෙන් මෙගා වොට් 4.3%ක ධාරිතාවයකින් යුක්ත වේ. මෙම ව්‍යාපෘතිය දූපතේ වෙසෙන ජාතික විදුලි පද්ධතිය හා සම්බන්ධයක් නොමැති ජනතාවගේ විදුලි අවශ්‍යතා සපුරාලයි.

4. මහ කොමසාරිස්තුමා ඩෙල්ෆ්ට් දූපතේ ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය කළ අතර ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නිලධාරීන්, ව්‍යාපෘති කොන්ත්‍රාත්කරු සහ ප්‍රතිලාභී ප්‍රජාව සමඟ නියැළුණේය.

5. මෙම ව්‍යාපෘතිය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අචල සහ ජනතා කේන්ද්‍රීය සංවර්ධන සහයෝගීතාවයේ සංකේතයක් වන බව පැවසූ මහ කොමසාරිස්තුමා දේශීය ප්‍රජාවන්ට සෘජුවම ප්‍රතිලාභ සලසන ඉන්දිය ප්‍රදාන ව්‍යාපෘතීන් තුළින් ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ප්‍රමුඛතාවයන්ට සහය ලබා දීමට ඉන්දියාව අඛණ්ඩව කැප වී සිටින බව සඳහන් කළේය.

***

***2026* ජූනි *06***
**කොළඹ**